දිනමිණ
The Dinamina



# ද. ආසියානු පාරිසරික සහයෝගීතා වැඩ සටහන විධිමත් කිරීමට මූල්‍ය ප්‍රතිපාදන තවදුරටත්

ශීලා උඩුවර

දකුණු ආසියානු පාරිසරික සහයෝගීතා වැඩසටහන (සකෙප්) වඩාත් විධිමත්ව පවත්වාගෙන යාම සඳහා තවදුරටත් මූල්‍යමය ප්‍රතිපාදන ලබාදීමට එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ දකුණු ආසියානු හා ශාන්තිකර කලාපයේ අධ්‍යක්ෂ සුරේන්ද්‍ර ෂේර්තා මහතා එකඟත්වය පළකර තිබේ. සුරේන්ද්‍ර ෂේර්තා මහතා පාරිසරික හා ස්වභාවික සම්පත් ඇමැති ඒ් එච්. එම්. පවුසි මහතා සමග එම අමාත්‍යංශයේ පැවැති විශේෂ සාකච්ඡාවකදී මෙම එකඟත්වය පළකර තිබේ.



එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහනේ දකුණු ආසියානු සහ ශාන්තිකර කලාපයේ අධ්‍යක්ෂ සුරේන්ද්‍ර ෂේර්තා මහතා පරිසර හා ස්වභාවික සම්පත් ඇමැති ඒ. එච්. එම්. පවුසි මහතා සමග එම අමාත්‍යංශයේදී සාකච්ඡා පැවැත්වූ අවස්ථාව.

ධරණීය සංවර්ධනය උදෙසා ජාතික මණ්ඩලයක් පිහිටුවීම සඳහා එක්සත් ජාතීන්ගේ පාරිසරික වැඩසටහන සමග අවබෝධතා ගිවිසුමකට එළඹීමටත් එම මණ්ඩලය ස්ථාපිත කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමටත් එකඟ විය.

වායු දූෂණය අවම කිරීම සඳහා ප්‍රවාහනයට විකල්ප ක්‍රම ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳවත් නාගරිකකරණයත් සමග ඇතිවන පාරිසරික ගැටලු අවම කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳවත් මෙහිදී සාකච්ඡා කෙරිණි. දුඹුරු වලාවත් වෙතින් ඇතිවන බලපෑම් සමාලෝචනය කිරීම සඳහා මාලදිවයිනේ පිහිටුවා ඇති මධ්‍යස්ථානයෙන් අවශ්‍ය උදව් ලබාදීමටද මෙහිදී අධ්‍යක්ෂවරයා එකඟවිය.

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යංශයේ ලේකම් ඩී. දිසානායක, දකුණු ආසියානු පාරිසරික වැඩ සටහනේ ව්‍යාපෘති අධ්‍යක්ෂ කුමාර් කෝනා, අතිරේක ලේකම් ඩබ්ලිව්. ආර්. එම්. එස්. වික්‍රමසිංහ යන මහත්වරුද මෙම අවස්ථාවට සහභාගිවූහ.